Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE

MINISTÈRE DE LA JUSTICE

12

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## යුරෝපා සංගමය තුළ අත්අඩංගුවට ගැනීමට හැකි වරෙන්තුවක් ලැබීම නිසා අත් අඩංගුවේ පසුවන හෝ තාවකාලික ව හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීමට කරන ලද ඉල්ලීමක් සහිත පුද්ගලයකුට ඇති සහන

ඔබ ව සිර භාරයට පමුණුවා ඇත්තේ යුරෝපය තුළ අත්අඩංගුවට ගත හැකි වරෙන්තුවක් සහ තාවකාලික හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීමට කරන ලද ඉල්ලීමක් හේතුකොටගෙන ය. ඔබට රැකවරණය ලැබිය හැකි මූලික අයිතීන් මෙම ලේඛනයෙන් දක්වා ඇත.

**පහත දැක්වෙන තොරතුරු ඔබට අවබෝධ වන භාෂාවකින් ඔබ වෙත ලබාදිය යුතුය.**

***<u>ඔබ සිර අඩස්සියේ සිටින මුළු කාලය පුරාවට ම මෙම ලේඛනය ඔබ සන්තකයේ තබා ගත හැක</u>***

ඔබව අත් අඩංගුවට ගෙන ඇත්තේ වෙනත් රටක් මගින් යුරෝපා සංගමය තුළ ක්‍රියාත්මක වන පරිදි පනවා ඇති සිර දඬුවමක් හෝ වරෙන්තුවක් මත හෝ තාවකාලික ව හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීම සඳහා වන වරෙන්තුවක් ඔබට එරෙහි ව නිකුත් කර ඇති විටක.

### වරදකාරී ක්‍රියාව සිදු කිරීම පිළිබඳ දැනුම

යුරෝපා සංගමය තුළ අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් ලබා තිබීම හෝ තාවකාලික ව හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීම සඳහා වන වරෙන්තුවක් ඔබට එරෙහි ව නිකුත් කර ඇති විටක, ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

### නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම

**<u>නීතිඥවරයකු තෝරා ගැනීම</u>**

රඳවා තබාගැනීමට පෙර ඔබ විසින් තෝරා පත් කළ හෝ ඔබ වෙනුවෙන් පත් කළ නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත. ඔබ හට නීතිඥවරයකු පත් කර ගැනීමට හැකියාවක් නොමැත්තේ නම් හෝ තෝරා ගත් නීතිඥවරයා සම්බන්ධ කරගත නොහැකි නම් පත් කළ නීතිඥයකුගේ සහාය සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.

ඔබ විසින් දැනුම් දෙන ලද තැනැත්තකු විසින් ද ඔබගේ නීතිඥවරයා ව, සමහර විට, පත් කර තිබිය හැක. එවැනි අවස්ථාවක දී ඔබ විසින් එකී නීතිඥවරයාගේ පත් කිරීම දැනුම් දිය යුතු වේ.

**<u>නීතිඥවරයාගේ සහය සහ මැදිහත් වීම් සඳහා වන සීමා</u>**

සිදු කරනු ලබන සාකච්ඡාවේ රහස්‍යභාවය සුරක්ෂිත කරමින් පුරා විනාඩි 30 ක කාලයක් ඔබ සමග සාකච්ඡාවේ යෙදීමට ඔබගේ නීතිඥවරයාට හැක.

ඔබගෙන් පලමු වරට ප්‍රශ්න කිරීම ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීමට අවශ්‍ය වූ විටකදී හැර, ඔබගේ නීතිඥවරයාට දැනුම් දී පැය දෙකක් පසුවීමට පෙර පටන් ගත නොහැක.

ඔබේ නීතිඥවරයා පැමින සිටී නම්, ප්ශ්න කිරීම අතරතුරදී එය නවත්වා ඔහු හෝ ඇය සමග කතාකිරීමට ඔබට හැකියාව ඇත.

### නිශ්ශබ්ද ව සිටීමට ඇති අයිතිය

රඳවා තබාගැනීම අතරතුරදී, ප්‍රකාශ සිදු කිරීම, ඔබෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම හෝ නිශ්ශබ්ද ව සිටීමට ඔබට අයිතියක් ඇත.

### භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**නිදහස සීමාවන කාලසීමාව සහ ඉන් අනතුරුව සිදුවන පටිපාටිගත ක්‍රියාමාර්ග**

අතරමැද දීර්ඝකිරීමකින් තොරව පැය 48ක් දක්වා ඔබව රඳවා තබාගත හැක.

මෙම කාලය පසුවූ පසු ඔබව අදාළ ප්‍රදේශයේ මහජන පැමිණිලිකරු වෙත හෝ ව්‍යාපෘත අභිචෝදක වෙත කැඳවා ඔබගේ අනන්‍යතාවය තහවුරු කර ඔබට අවබෝධ වන භාෂාවකින්,යුරෝපා සංගමය තුළ ඔබට එරෙහිව නිකුත් කර ඇති වරෙන්තුව සහ එහි අඩංගු දෑ හෝ තාවකාලික ව හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීම සඳහා වන වරෙන්තුව සහ එහි අඩංගු දෑ පිළිබඳව දැනුම් දෙනු ඇත, මෙම අවස්ථාව සඳහා ඔබ විසින් තෝරා පත් කළ හෝ ඔබ වෙනුවෙන් පත් කළ නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඔබට හැකියාව ඇත.

මෙම අවස්ථාවේදී ඔබේ පත්කල නීතිඥවරයා සමග කෙලින්ම කතා කළ හැකි අතර, ඔහුට/ඇයට මේ පිළිබඳව නීති උපදෙස් පැතිය හැක.

යුරෝපා සංගමයේ වරෙන්තුව පිළිබඳව දැනුම් දීමෙන් අනතුරුව, නීතිපතිවරයා ඔබව නිදහස් නොකිරීමට තීරණය කළේ නම්, ඔබව අභියාචනාධිකරණයේ පලමු විනිසුරුවරයාට හෝ ඔහු විසින් පත් කළ විනිසුරුවරයෙකුටඉදිරිපත් කෙරේ. ඉන් අනතුරුව:

- ඔහුට/ඇයට ආකෘතික උදර්පන පත්‍රිකා ලැබෙන තුරු (අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව කාලසීමා වෙනස්විය හැක.) හා යුරෝපා සංගමයේ වරෙන්තු හෝ උදර්පන පත්‍රිකා මගින් කර ඇති ඉල්ලීම් අනුව ඔබව අධිකරණයට ගෙන්වා අධිකරණ තීරණ දැනුම්දීම සිදුකළ හැකිය.

- එසේ නැතහොත්, ඔහුට හෝ ඇයට ඉදිරි නීති කටයුතු සඳහා ඔබගේ සහභාගීත්වය පිළිබඳව ප්‍රමාණවත් සහතිකයක් ඇතිවිට ඔබව අධිකරණයේ අධීක්ෂණයට යටත්ව හෝ, ඉලෙක්ට්‍රොනික ආවේක්ෂණයට යටත්ව නිවාස අඩස්සියේ හෝ, අධිකරණයේ අධීක්ෂණයකින් තොරව, ආකෘතික උදර්පන පත්‍රිකා ලැබෙන තුරු හෝ අධිකරණ මෝසම් කටයුතු හරහා ඔබව උදර්පනය කිරීමට බලාපොරොත්තු වන රාජයය වෙත ඔබව නිදහස් කිරීම තීරණය කිරීම වනතෙක් ඔබව රඳවා තබාගත හැක.

**ඔබට ලබා දිය යුතු සහන සඳහා අනුමැතිය ලබා ගැනීමට ඇති හැකියාව**

ඔබ ව සොයනු ලබන රටට නැවත යැවීම පිළිබඳ ව කැමැත්ත ලබා දීම හෝ නොදීම සම්බන්ධයෙන් ඔබට අයිතියක් ඇත. යම් කැමැත්ත ලබා දීමක දී, ඉතා කෙටි කලකින් ඒ පිළිබඳ ව තීන්දුවක් දීමට අධිකරණය ක්‍රියා කළ යුතු වේ. යුරෝපා සංගමය තුළ අත්අඩංගුවට ගැනීම සඳහා නිකුත් කළ වරෙන්තුවකට කැමැත්ත දීමේ දී ඔබ හට එකී තීරණය පසුව වෙනස් කළ නොහැක.

**සමහර පුද්ගලයන් පිළිබඳ තොරතුරු**

ඔබ රඳවා තබාගන්නේ ඇයි යන්න ඔබගේ පවුලේ සාමාජිකයන් ඇතුළු වෙනත් ඔබ කැමති අයෙකුට දැන්වීම සඳහා ඔබට අයිතියක් ඇත.
ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමේ හැකියාව ඇත.

**වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීම**

රඳවා තබාගන්නා කාලය තුළ වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂණයක් ලබාගැනීමට ඔබට ඉල්ලීමක් කළ හැක.